**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.9,671,595 ක ස්ථාවර වත්කම් අයිතම 13 ක් ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු වටිනාකම් හා නව ඉදිකිරීම් වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කර ගන්නා බව කරුණිකව සඳහන් කරමි. |
| (ආ) | සභාව සතු සුසාන භූමි 09 ක, ක්‍රීඩා පිටි 11 ක හා ඉඩම් 04 ක, වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම්වල තක්සේරු වටිනාකම ලබා ගැනීමට තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත යවා ඇති අතර එම තොරතුරු ලැබුණු පසු ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ට්‍රැක්ටරයක හා ට්‍රේලරයක වටිනාකම රු. 1,026,500 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 1,512,200 ක් ලෙස දක්වා තිබුණි. | වත්කම් වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට තොග ලෙජර අනුව නිවැරදි තොග වටිනාකම රු. 2,647,630 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එය රු. 2,771,161 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතු වේ | විගණන විමසුමේ පෙන්වා දී ඇති තොග ශේෂවල මුළු එකතුව රු.2,647,630 ක් ලෙස සදහන් කළද එය නිවැරදි තොග ශේෂයන් නොවන අතර, නිවැරදි තොග ශේෂවල වටිනාකම රු.2,771,161 ක් බව නැවත පරීක්ෂාවේදීද තහවුරු විය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 4,503,117 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,747,867 ක් ලෙස දක්වා තිබුණි. | ලැබිය යුතු මුදල් නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයට අයත් උසාවි දඩ නිවැරදි ලෙස ගිණුම්ගත කළද මෙය මුද්‍රණය කිරීමේදී මුද්‍රණ දෝෂයකින් ශීර්ෂ මාරු වී ඇති බව පිළිගනිමි. |
| (ඊ) | කර්මාන්ත ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණය හිමි ශේෂය රු.55,886,935 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු. 56,065,862 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණන විමසුමේ පෙන්වා දී ඇති අඩුපාඩු 2019 මූල්‍ය ප්‍රකාශනයේදී සකස් කරගැනීමට කටයුතු කරමි. |
| (උ) | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 22,097,716 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | මූල්‍ය වාර්තාවේ හා ස්ථාවර වත්කම් ලේඛන සසදා බලා පෙන්වා දී ඇති මෙම වටිනාකම් නිවැරදි කරගැනීමට කටයුතු කරමි. |

**1.4** අනුකූල නොවීම්

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

--------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශිය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) 65 | කර්මාන්ත බදු ගෙවීම් පැහැර හරින ලද අයගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ගෙවීම් පැහැර හරින ලද අයගේ ලේඛනයක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියට එවැනි ලේඛනයක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කරමි. |
| (ii) 218 | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් පරීක්ෂා කර නොතිබුණි. | රීති ප්‍රකාරව සභාව සතු ඉඩම් පිළිබඳ සමීක්ෂණ කටයුතු කළ යුතු වේ. | අප සතුව කාර්මික නිළධාරීන් මහතුන් එක්කෙනෙකු පමණක් සිටින බැවින් සියළු ඉඩම් වර්ෂයක් පාසා පරීක්ෂා කර බැලීමට නොහැකි වූ අතර ඉදිරියේදී සේවක ඌණතාවය මග හැරුණු පසු අනෙකුත් සියළු ඉඩම් පරීක්ෂා කිරීමට කටයුතු කරමි. |
| (ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කරමි. |

**02.** මූල්‍ය සමාලෝචනය

---------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,025,962 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,467,280 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. | වරිපනම් හා බදු | 4,328 | 4,523 | 4,642 | 932 | 3,380 | 4,290 | 3,349 | 1,050 |
| II. | බදු කුලී | 22,043 | 21,106 | 21,101 | 14,773 | 22,121 | 19,038 | 16,646 | 14,041 |
| III. | බලපත්‍ර ගාස්තු | 2,057 | 3,198 | 3,198 | 06 | 3,340 | 2,367 | 2,361 | 06 |
| IV. | වෙනත් ආදායම් | 110,804 | 70,844 | 76,215 | 15,638 | 90,667 | 64,063 | 66,769 | 22,101 |
| එකතුව | | 139,232 | 99,671 | 105,156 | 31,349 | 119,508 | 89,758 | 89,125 | 37,198 |

සටහන

2017 හා 2018 වර්ෂවල රැස්කළ ආදායම අගය තුළ පසුගිය වර්ෂවලට අදාළ හිඟහිටි ලැබීම්ද ඇතුළත්ව තිබුණි.

### 2.2.2 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 433,315 ක් වූ හිඟ කඩකුලී ශේෂයෙන් වසරකට වැඩි ශේෂය රු. 68,835 ක් විය. | නියමිත කාලය තුළ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විගණන විමසුමේ පෙන්වා දී ඇති මුදල රු.433315 කි. |
| (ආ) | 2014 මාර්තු අවසන් වන විට ගෙවා අවසන් විය යුතු පොදු වෙළඳපොළ කඩ කාමර 03 කට අදාළව පෙර ගෙවුම් රු. 1,254,178 ක් අයවිය යුතුව පැවති අතර 2017 වර්ෂයේදී පෙර ගෙවුම් ක්‍රමය යටතේ ලබා දී ඇති, 2018 දෙසැම්බර් 12 දිනට අයවිය යුතුව පැවති රු. 3,705,306 ක මුදලින් රු. 2,190,240 ක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි. | නියමිත කාලය තුළ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩ කාමර සම්බන්ධයෙන් කඩ හිමියන් දැනුවත් කොට පෙර ගෙවුම් මුදල් ගෙවන ලෙස දන්වමින් ලිපි යවා ඇති අතර, එසේ නොගෙවුවහොත් කඩ කාමරය සභාවට පවරා ගන්නා බවද එහි සඳහන් කොට ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාර්ෂික ටෙන්ඩර් මත දේපල බදු දීම් වලින් සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන අවස්ථා 10 කට අදාළ රු. 864,236 ක හිඟ බදු කුලී මුදලක් හා සමාලෝචිත වර්ෂයට අදාළ රු. 1,144,013 ක හිඟ බදු කුලී මුදලක්ද අයවිය යුතුව පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව බදු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විමසුමේ ඇති කරුණු සත්‍ය බව පිළිගනිමි. |

**2.2.3** බලපත්‍ර ගාස්තු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කර්මාන්ත සැකැස්ම හා පාරිසරික හේතූන් මත පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොමැති වී මෝල් 14 ක්, වඩුමඩු 04 ක් හා දැව ඉරුම්හල් 05 ක් සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. | මහජන සෞඛ්‍ය පරික්ෂක නිර්දේශකර නොමැති කර්මාන්ත අධීක්ෂණය කර ඉදිරි කටයුතු කළ යුතු වේ. | මහජන සෞඛ්‍ය පරික්ෂක වෙත යොමු කිරීමෙන් අනතුරුව සුදුසු බවට නිර්දේශ වුවහොත් පමණක් බලපත්‍ර ලබාදීම සිදු කෙරේ. නුසුදුසු බව නිර්දේශ වී ඇති විට බලපත්‍රය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4** වෙනත් ආදායම්

--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දීමෙන් අයවිය යුතු හිඟ කුලී රු.3,235,919 ක් වූ අතර මෙහි වසර 01 කට වැඩි කාලයක් තුළ හිඟව පවතින රු. 3,016,308 ක් විය. | සභා කර්මාන්ත සඳහා අයවිය යුතු මුදල් ගිණුම් අතර මාරු කිරීමටත් වෙනත් ආයතන හා පුද්ගලයන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දි නිරවුල් කිරීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | තලන රෝල කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 1,314,972 ක් වූ හිඟ කුලී වලින් වසරකට වැඩි ශේෂය රු. 1,309,472 ක් විය. | මෙතෙක් අය වී නොමැති බැවින් ආයතන හා පුද්ගලයන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය කර ගැනීමට ඇති මුදල් සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුට අදාලව නීතිමය කටයුතු සිදු කර ඇති අතර ඉතිරි මුදල් ද අය කර ගැනීමට කටයුතු සිදුකෙරෙමින් පවතී. |
| (ඇ) | JCB යන්ත්‍රයෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 2,665,358 ක් වූ | මෙතෙක් අය වී නොමැති බැවින් ආයතන හා | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

| | |
|---|---|
| හිඟ කුලී තුළ වසරකට වැඩි කාලයක සිට පැවත එන ශේෂය රු. 1,302,656 ක් විය. | පුද්ගලයන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) කර්තව්‍යයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අයවැයගත රු. 18,439,476 ක් වූ කර්මාන්ත 40 ක් ඉටුකර නොතිබුණි. | අයවැයගත කර්මාන්ත ඉටු කිරීමට අවධානය යොමු කළ යුතු වේ. | කර්මාන්ත විස්තරය ඉදිරිපත් කර ඇත. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට අලි ඇතුන් ඇතුල් වීම වලක්වා ගැනීම සඳහා යොදා ඇති අලිවැට අක්‍රීය වී වසර දෙකක පමණ කාලයක් ගත වී තිබුණද අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අලිවැට අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | තාක්ෂණ ඇගයීම් වාර්තාවක් අප සභාවට ලබාගැනීමට නොහැකි බැවින්, ගල්ගමුව වනජීවී කාර්යාලයට යොමු කර තාක්ෂණ ඇගයීම් වාර්තාවක් ලබාගෙන මෙම අලි වැට සකස් කරගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු .20,628,855 ක් වූ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | එම මුදල් කඩිනමින් නිරවුල් කරගැනීමට විෂය භාර නිළධාරීන්ට උපදෙස් ලබාදුන් බව සදහන් කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.7,973,605 ක් වූ තැන්පත් මුදලින් ආපසු ගෙවිය හැකි තැන්පත් හඳුනාගෙන ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුවේ. | තැන්පත් මුදල් හැකි ඉක්මණින් අදායමට ගැනීමට හෝ අදාළ තැන්පත් හිමියන්ට ගෙවීමට කටයුතු කරමි. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ අනුමත පුරප්පාඩු 19 ක් හා අතිරික්ත 34 ක් පැවතුණි. | අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදු නොකිරීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු තනතුරු 19 ක් පැවති අතර මේ වන විට තනතුරු 03 ක්, බඳවා ගත් අතර සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) තනතුරු 06 ක් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |

**3.4** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ දේපළ තක්සේරු කිරීමෙන් අනතුරුව සිදුවූ නව ඉදිකිරීම් සඳහා තක්සේරු වාර්තා ලබාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නව ඉදිකිරීම් සඳහා තක්සේරු වාර්තා ලබාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | සුදුසුකම්ලත් හා විධිමත් පුහුණුවක් ලත් නිළධාරීන් නොපැවතීම නිසා එසේ කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරියේ දී පළාත් පාලන කොමසාරිස්තුමා සමඟ සාකච්ඡා කොට ඒ පිළිබඳව කටයුතු කරමි. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 07 ක් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කර ගිණුම්ගත කළ යුතු වේ. | ඉතා කඩිනමින් පවරා ගැනිම් සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |
| (ආ) සභාව විසින් නඩත්තු කරනු ලබන සුසාන භූමි 93 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීම් කඩිනම් කළ යුතු වේ. | මේ සෑම සුසාන භූමියක්ම අදාළ එක් එක් ආයතන වෙත අදාළ නිර්දේශයන් ලබාගැනීම සඳහා අප යවා ඇති අතර ඒ ඒ ආයතනවල පවතින ප්‍රමාදයක් නිසා පවරා ගැනීම ප්‍රමාද වේ. |
| (ඇ) 2004 වර්ෂයේදී ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම සඳහා මැනුම් සිදුකර වෙන්කොට ඇති මහා නාන්නේරිය, නවගත්තේගම ප්‍රධාන මාර්ගයට මායිම්ව පැවති හෙක්ටයාර් 0.152 ක් වූ ඉඩම් ප්‍රමාණය 2018 නොවැම්බර් 13 වන විටත් පවරා ගැනීමේ කටයුතු සිදුකර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පැවරීම් කටයුතු සිදුකර දෙන ලෙස දිගින් දිගටම ඉල්ලීම් කළද මේ වනතෙක් පැවරීම් කටයුතු ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් විසින් අප වෙත පවරා දීමට කටයුතු සිදුකර නොමැති බව සඳහන් කරමි. |

#### 3.5.2 නිශ්ක්‍රිය /ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාව සතුව පවතින රු.362,500 ක් වූ වාහන 03 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රිය තත්ත්වයේ පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් අළුත්වැඩියා කිරීමට හෝ ඉවත්කිරීමට කටයුතු කළ යුතු වේ. | එම වාහන ධාවනයට නුසුදුසු තත්ත්වයේ පවතින බවත්, ඉදිරියේදී යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ උපදෙස් මත වෙන්දේසි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) සභාව සතුව පවතින රු.3,832,795 ක් වූ වත්කම් 15 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් අළුත්වැඩියා කර ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට අවධානය යොමු කළ යුතු වේ. | දැනට පාවෙන අවන්හලෙහි වහළය සකස් කර ටෙන්ඩර් කර සභාවට මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. මෙරිගෝ රවුම් 10 අළුත්වැඩියා කරමින් පවතින අතර හංස බෝට්ටු 04 තව දුරටත් එම තත්ත්වයේ පවතින බව සඳහන් කරමි. |

## 3.6 ප්‍රසම්පාදන

--------------

### 3.6.1 සැපයීම් හා සේවා

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වීථි පහන් උපකරණ මිලදී ගැනීම සඳහා ලැබී තිබූ අවම මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට පිළිගත හැකි හේතූන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කර නොතිබුණු අතර, අවම මිල ගණන් ඇගයීමට ලක් නොකිරීම මත සභාවට රු. 162,600 ක අලාභයක් සිදු වී තිබුණි. | සභා අරමුදලට වාසිදායක වන පරිදි ගුණත්වයෙන් උසස් භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ යුතු වේ. | මිල ගණන් ඉදිරිපත් කර නොමැති භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය වූ විට එම භාණ්ඩ මිලදී ගැනීමේදී තවත් ආයතන කිහිපයකට යාමට සිදුවීම දැඩි අපහසුතාවයක් බැවින් එම ආයතනවල මිල ගණන් සැසඳීමට භාජනය නොකරන ලදී. |